# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2011

### 2013 මැයි - අගෝස්තු

### මානවශාස්ත්‍ර පීඨය

### බෞද්ධ දර්ශනය - BUPH E 1015

### භාරතීය දාර්ශනික පසුබිම හා බෞද්ධ දර්ශනයේ පදනම

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි | කාලය : පැය 03 යි

---

01. ඉන්දුනිම්න ශිෂ්ටාචාරයේ පැවැති ආගමික විශ්වාස වෛදික චින්තාවේ සංවර්ධනය පිණිස ඉවහල් වූ අයුරු පෙන්වා දෙන්න.

02. වෛදික බහුදේවවාදය, ක්‍රමයෙන් ඒකෙකේශ්වරවාදය සහ ඒකදේවවාදය දක්වා විකාසය වූ බව සනාථ කරන්න.

03. කාන්තාව පිළිබඳ බමුණන් විසින් දරන ලද මතය ප්‍රතික්ෂේප කිරීම සඳහා බුදුදහමින් ඉදිරිපත් කෙරෙන තර්කානුකූල සාධක ගෙනහැර දක්වන්න.

04. "උපනිෂද්" චින්තනයෙහි සුවිශේෂතා එම වචන නිරුක්තිය ඇසුරින් විශද කරන්න.

05. කිරියවාදය සහ අකිරියවාදය අතර පවත්නා විෂමතා ඉදිරිපත් කොට, කිරියවාදී ශාස්තෘවරයෙක් පිළිබඳ ලුහුඬු විවරණයක් කරන්න.

06. නිත්‍යාත්මයක පැවැත්ම නිශේධනය කිරීම පිණිස ත්‍රිලක්ෂණ ඉගැන්වීම් ප්‍රමාණවත් වන අයුරු මූලාශ්‍රය ඇසුරින් පැහැදිලි කරන්න.

07. දුක්ඛ ආර්‍ය සත්‍යය පදනම් කොටගෙන බුදුදහම සර්වාසුභවාදයක් ලෙස හඳුන්වාදිය හැකි දැයි පරීක්ෂා කරන්න.

08. "නිබ්බන්ති ධීරා යථායං පදීපො" යන පාඨය පදනම් කොටගෙන නිවනේ ස්වභාවය විස්තර කරන්න.

09. කර්මය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම කෙටියෙන් විස්තර කොට එය නියතිවාදයක් හෝ පුබ්බේකත හේතුවක් නොවන අයුරු පෙන්වා දෙන්න.

10. පහත සඳහන් මාතෘකා අතුරින් <u>දෙකකට</u> කෙටි සටහන් ලියන්න.

    i. මධ්‍යම දේශනාව හා මධ්‍යම ප්‍රතිපදාව
    ii. සංජය බෙල්ලට්ඨිපුත්ත තුමා
    iii. නාමරූප විභාගය
    iv. බ්‍රාහ්මණ යාග කර්ම

***********************************